2025-05-09

Learning Resource Center
R
De Mazenod College
Kandana

# De Mazenod College – Kandana.

## පළමුවන වාර පරීක්ෂණය

## ගණිතය

## 7 ශ්‍රේණිය

කාලය - පැ. 2

- ප්‍රශ්න සියල්ලටම මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 ක් හිමිවේ.

01. මෙම රූපයේ සමමිතික අක්ෂ ගණන කීයද?



02. 81, 3 හි බලයක් ලෙස දක්වන්න.

03. $a = 3$ වනවිට $3^2 a^2$ හි අගය සොයන්න.

04. විශාලත්වය අනුව a හා b කෝණ නම් කරන්න.




05. ක්‍රි.ව. 2025 අයත්වන දශකය හා සියවස ලියන්න.

06. හිස්තැනට ගැළපෙන සංකේතය වරහන් තුළින් තෝරා ලියන්න. ( > , < , = ) $4^3$ ............ $3^4$

07. 24, 36, 60 හි මහා පොදු සාධකය සොයන්න.

08. ක්‍රි.ව. 1700 අධික අවුරුද්දක් වන බව සමන් පවසයි. ඔබ එයට එකඟ ද? හේතු දක්වන්න.

09. පැත්තක් දිග 12 cm වන සමචතුරශ්‍රයක පරිමිතිය සමාන පරිමිතියක් ඇති සමපාද ත්‍රිකෝණයක පාදයක දිග සොයන්න.

10. සෘජුකෝණාශ්‍ර දෙකක අගය ඇති කෝණයෙහි නම කුමක් ද?

11. $\frac{5}{12} + \frac{1}{4}$

12. සුළු කරන්න

| මාස | දින |
|---|---|
| 7 | 15 |
| + 3 | 13 |

13. පහත දැක්වෙන සංඛ්‍යා හතරෙන් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා තෝරා යටින් ඉරක් අඳින්න.

a) 235 b) 356 c) 1249 d) 3460

14. 36 ප්‍රථමක සාධක වල ගුණිතයක් ලෙස ලියන්න.

15. P = {10 ට අඩු ප්‍රථමක සංඛ්‍යා } මෙම කුලකය වෙන් රූපයකින් දක්වන්න.

16. 32 .......... යන සංඛ්‍යාව 4 න් හා 6 න් බෙදේ. හිස් තැනට තිබිය යුතු ඉලක්කම ලියන්න.

17. සුළු කරන්න. $5 + 3 (2 + 4) \div 6$

18. සංඛ්‍යාවට අදාළ බලය යා කරන්න.

| සංඛ්‍යාව | බලය |
|---|---|
| 8 | $3^2$ |
| 27 | $2^3$ |
| 16 | $3^3$ |
| 9 | $4^2$ |

19. 24 හි සාධක සියල්ල ලියන්න (එක් සාධකයක් හෝ මග හැරුණහොත් ලකුණු අහිමිවේ)

20. 5 x 5 x P x P x 5 x P දර්ශක ආකාරයෙන් ලියන්න.

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.

01. a) i) යම් සංඛ්‍යාවක ඉලක්කම් දර්ශකය යනු කුමක් ද? (ල.02)

ii) පූර්ණ සංඛ්‍යාවක් 6 න් බෙදීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා 2 ක් ලියන්න. (ල.02)

iii) 52 ........ මෙම සංඛ්‍යාව 6 න බෙදේ. හිස්තැනට සුදුසු ඉලක්කම ලියන්න. (ල.01)

b) i) 3208 හි ඉලක්කම් දර්ශකය සොයන්න. (ල.02)

ii) 18 හි සාධක සියල්ල ලියා දක්වන්න (එක් සාධකයක් හෝ මග හැරුණහොත් ලකුණු අහිමිවේ) (ල.02)

iii) 100 ප්‍රථමක සාධක වල ගුණිතයක් ලෙස ලියා දක්වන්න. (ල.02)

c) i) 18 , 27 , 36 හි මහ පොදු සාධකය ප්‍රථමක සාධක වල ගුණිතයක් ලෙස ලිවීමෙන් සොයන්න (ල.02)

ii) LED බල්බ් සහිත පරිපථයක රතු, නිල්, කහ වර්ණ වලින් යුත් බල්බ් පිළිවෙලින් තත්පර 20,30,40 කට වරක් දැල්වෙන සේ සකස් කර ඇත. මුල්වරට බල්බ තුනම එකවර දැල්වූයේ නම් නැවත තුනම එකවර දැල්වෙන්නේ තත්පර කීයකට පසුවද ? (ල.03)

Learning Resource Center
R
De Mazenod College
Kandana

02. a) i) කුලකයක් යනු කුමක් ද? (ල.02)

ii) P={1 ත් 20 අතර ප්‍රථමක සංඛ්‍යා }
P කුලකයේ අවයව සඟලවරහන් තුල ලියන්න (ල.02)

iii) A= {1,4,9,16} A කුලකයේ අවයව නිශ්චිතව හඳුනාගත හැකි පොදු ලක්ෂණය මගින් ලියා දක්වන්න. (ල.02)

b) i) වෙන් රූප සටහන් සංකල්පය සොයා ගන්නා ලද්දේ කවුරුන්ද ? (ල.02)

ii) B { 0 ත් 20 අතර ඇති ත්‍රිකෝණ සංඛ්‍යා } B කුලකයේ අවයව වෙන් රූප සටහනකින් දක්වන්න. (ල.02)

iii) Y= {COLOMBO යන වචනයේ අකුරු } යන කුලකය වෙන් රූප සටහනකින් දක්වන්න. (ල.02)

03. i) $7^3$ හි පාදය හා දර්ශකය ලියා දක්වන්න. (ල.02)

ii) 3 x 3 x 5 x 5 x 5 බලවල ගුණිතයක් ලෙස ලියන්න (ල.02)

iii) $2^2 \times 5^2$ හි අගය සොයන්න (ල.02)

iv) 72 පාද ප්‍රථමක සංඛ්‍යාවවූ බලවල ගුණිතයක් ලෙස ලියන්න (ල.02)

v) 7 x 7 x P X P x P x b x b දර්ශක ආකාරයෙන් ලියන්න (ල.02)

vi) x = 2, y = 3 වනවිට $5X^2\ y^3$ හි අගය සොයන්න. (ල.02)

04. a) i) ද්විපාර්ශ්වික සමමිතික තල රූපයක් යනු කුමක් ද? (ල.01)

ii) ද්විපාර්ශ්වික සමමිතික තලරූපයක විශේෂ ලක්ෂණයක් ලියා දක්වන්න. (ල.01)

iii) පහත දැක්වෙන සමමිතික අක්ෂ ගණනට සමාන තල රූප ඇඳ ඒවායේ නම් ඉදිරියෙන් ලියා දක්වන්න.
කවද සමමිතික අක්ෂ තල රූපයේ ලකුණු කරන්න. (ල.04)

සමමිතික අක්ෂ 1 ක් පමණක් =
සමමිතික අක්ෂ 2 ක් පමණක් =
සමමිතික අක්ෂ 3 ක් පමණක් =
සමමිතික අක්ෂ 4 ක් පමණක් =

b) i) 42 ප්‍රථමක සාධක වල ගුණිතයක් ලෙස ලියන්න. (ල.02)

ii) ඉහත ප්‍රථමක සාධක ඇසුරෙන් 42 හි සියලු සාධක ලබා ගන්න. (ල.03)

05. a) i) ඒකක භාග යනු මොනවා දැයි හඳුන්වා උදාහරණ 2 ක් ලියන්න (ල.02)

ii) දී ඇති භාග වලින් තත්‍ය භාග තෝරා ලියන්න.

$\frac{5}{3}$ $\frac{4}{6}$ $\frac{15}{8}$ $\frac{1}{5}$ $\frac{4}{2}$

iii) පහත දී ඇති තුල්‍ය භාග ගලපා යා කරන්න.

1) $\frac{2}{3}$ $\frac{3}{12}$

2) $\frac{8}{12}$ $\frac{1}{3}$

3) $\frac{1}{4}$ $\frac{2}{3}$

4) $\frac{7}{21}$ $\frac{6}{9}$ (ල.4)

b) සුළු කරන්න

1) $\frac{5}{8} + \frac{73}{24}$ ii) $\frac{3}{7} + \frac{5}{21}$ (ල.4)

**06.** i)මෙම රූපයේ ලකුණු කර ඇති ඉංග්‍රීසි අක්ෂර වලින් නිරූපිත කෝණ නම් කරන්න.

a. –

b. –

c. –

d. –

e. –




(ල.5)

b) i) විසඳන්න. 5 + (10-2) x6 ÷ 4 (ල.3)

ii) දානයක් සඳහා බෙදා දීමට බිනිස් ගෙඩි 48 ක් හා කෙසෙල් ගෙඩි 24 ක් ගෙනැවිත් ඇත.එහි පැමිණි සියලුදෙනාටම සමාන ප්‍රමාණ ලැබෙන සේ ඒවා බෙදා දිය හැකි උපරිම පුද්ගලයින් ගණන කීයද? (ල.3)